කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

IWWRMP

ලංසු සඳහා ආරාධනයයි

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

(IWWRMP)

ව්‍යාපෘති අංකය : P166865

ණය අංකය : IDA- 6619-LK

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ලෝක බැංකුව) වෙත ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IWWRMP) පිරිවැය අරඹයා ණය මුදලක් සඳහා අයදුම්කර ඇති අතර, එම ණය මුදලේ ලැබීම්වලින් කොටසක් පහත උපලේඛනයේ සඳහන් කොන්ත්‍රාත්තු යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

2. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන් IWWRM ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වගුව 01 හි සඳහන් කාර්යයන් සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රිත, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

වගුව 01

කාර්ය විස්තරය	අවශ්‍ය පළපුරුද්ද / සුදුසුකම්	ලංසු සුරක්ෂණය සහ වලංගු කාලය
ආධාරක උපාංග සහිත පරීක්ෂණ පොම්ප කිරීමේ ඒකකය සැපයීමේ ප්‍රසම්පාදනය – නැවත ටෙන්ඩර් කැඳවීම LK-MOMDE-367154-GO-RFB (ගෙනවිත් භාරදීමේ කාලය : දින 60)	I. සේවා දායකයින්ගේ විස්තර සහ සහතික කරන ලද අවසන් කිරීමේ වාර්තාවක් සමග ලේඛන/ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. II. විදේශීය / රාජ්‍ය ආයතන සමග වැඩ කිරීමේ පළපුරුද්ද. III. තාක්ෂණික කාර්යය මණ්ඩලය සහ අනෙකුත් සුදුසුකම් 37.2 වගන්තියේ (ලංසුකරුවන් සඳහා උපදෙස්) අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.	ලංසු සුරක්ෂණ මුදල : රු. 447,000.00 වලංගු කාලය : (දින 147) 2027.03.19 දක්වා
ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සඳහා ගිනි නිවන උපකරණ ප්‍රසම්පාදනය. LK-MOMDE-573820-GO-RFB (ගෙනවිත් භාරදීමේ කාලය : දින 90)	I. ලංසුකරු වසර 10ට වැඩි කාලයක් ව්‍යාපාරයේ යෙදී සිටිය යුතු අතර, පසුගිය වසර 5 තුළ අවම වශයෙන් සමාන ව්‍යාපෘති 3ක් සම්පූර්ණ කර තිබිය යුතුය. II. සේවදායකයින්ගේ විස්තර සහ සහතික කරන ලද අවසන් කිරීමේ වාර්තාවක් සමග ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. III. විදේශීය / රාජ්‍ය ආයතන සමග වැඩ කිරීමේ පළපුරුද්ද. VI. තාක්ෂණික කාර්යය මණ්ඩලයේ සහ අනෙකුත් සුදුසුකම් 37.2 වගන්තියේ (ලංසුකරුවන් සඳහා උපදෙස්) අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.	ලංසු සුරක්ෂණ මුදල : රු. 1,110,000.00 වලංගු කාලය (දින 147) 2027.03.19 දක්වා

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ලංසු ලිපිලේඛනයේ සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

4. ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීම සඳහා **https://www.iwwrmp.lk/ web/procurement/section/procurement-notices** යන වෙබ් අඩවියේ පළ කර ඇත.

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 07, ආනන්ද කුමාරස්වාමී මාවතේ අංක 96 පිහිටි මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, 2 වන මහලේ IWWRM ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) වෙතින් ලබාගත හැකි අතර, පෙර දැනුම් දීමක් මගින් (වැඩ කරන දිනයක් හිදී) ඉහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. (දුරකථන අංකය: 0112691163)

6. අපේක්ෂිත ලංසුකරුවන්ට, ඉහත සඳහන් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා වන නැවත නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව (මුදල් සඳහා වගුව 02 බලන්න) මුද්‍රිත් ගෙවීමෙන් අනතුරුව පූර්ව දැනුම් දීමකින් පසු (දුරකථන අංක : 011-2691163) වැඩකරන දිනයන්හි කොළඹ 07, ආනන්ද කුමාරස්වාමී මාවතේ අංක 96 හි මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ලේ 2 වන මහලේ IWWRM ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත සමාගමේ/ ආයතනයේ ලිපි ශීර්ෂයක ලියන ලද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හෝ ලංකා බැංකුවේ හයිඩ් පාක් ශාඛාවේ ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය නමින් පවත්වාගෙන යනු ලබන අංක 7042633 දරන ගිණුමට එකී නැවත නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව බැර කර ලබාගත් බැංකු තැන්පතු පත්‍රිකාවේ ස්කෑන් කරන ලද පිටපතක් ලංසු ලිපිලේඛන ඉල්ලා ලිඛිත ඉල්ලීම් ලිපියක් සමග **iwwrmp@sltnet.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවීමෙන් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.

7. පූර්ව ලංසු රැස්වීමක් හා වැඩ බිම් සංචාරයක් පහත වගුව 2 හි සඳහන් පරිදි කොළඹ 07, ආනන්ද කුමාරස්වාමී මාවත, අංක 96, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, 2 වන මහල, IWWRMP හි PMU සම්මන්ත්‍රණ කාමරයේදී පවත්වනු ලැබේ. අදාළ නිලධාරීගේ සහාය ඇතිව වැඩ බිම පරීක්ෂා කර බලන මෙන් ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වගුව 02

කොන්ත්‍රාත් අංකය	නැවත නොගෙවන කැන්පතුව	තොරතුරු සහ ලංසු ලිපි ලේඛන ඉල්ලීම	පූර්ව ලංසු රැස්වීම	ලංසු අවසන් කිරීම සහ විවෘත කිරීම (දිනය සහ වේලාව)
LK-MOMDE-367154-GO-RFB	රු. 8,000.00	2026.10.26 දින සිට 2026.11.05 දින දක්වා 9.30 පැය සිට 15.00 පැය අතරතුර කාලයේදී	දිනය: 2026.11.02 වේලාව : පෙ.ව. 10.30	දිනය 2026.11.06 වේලාව : ප.ව. 2.00
LK-MOMDE-573820-GO-RFB	රු. 18,000.00	2026.10.26 දින සිට 2026.11.05 දින දක්වා 9.30 පැය සිට 15.00 පැය දක්වා අතරතුර කාලයේදී	දිනය : 2026.11.02 වේලාව : ප.ව. 12.30	දිනය 2026.11.06 වේලාව : ප.ව. 3.00

8. ලංසු ලිපිලේඛනයේ සියලුම පිටු ලංසුකරු විසින් අත්සන් කර ඔහුගේ මුද්‍රාව තබා තිබිය යුතුය.

9. සම්පූර්ණ කරන ලද ලංසු, පිටපත් දෙකකින් යුතුව, බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම හා අංකය පැහැදිලිව සඳහන් කර වගුව 02 හි සඳහන් පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂ, IWWRM ව්‍යාපෘතිය, 2 වන මහල, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමී මාවත, කොළඹ 07 වෙත ලියාපදිංචි තැපැල් මගින්, අතින් ගෙනවිත් භාරදීමෙන් හෝ සිඝ්‍රදූත සේවාව මගින් යොමු කළ යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටීමට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ දෙදෙනෙකුට (2) නොවැඩි බලයලත් නියෝජිතයන්ට අවසර දෙනු ලැබේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,
2 වන මහල, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල,
අංක 96,
ආනන්ද කුමාරස්වාමී මාවත,
කොළඹ 07.
2026.10.23